Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

සතිය: 39

**විෂය නර්තනය**

**ශ්‍රේණිය 13**

**සැකසුම:** දුල්මිණි මීගස්තැන්න.
ර/දොඩම්පෙ ශ්‍රී රාහුල මහා විද්‍යාලය

නිපුනතාවය :0.1නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.
නිපුනතා මට්ටම :1.2 සාම්ප්‍රදායික ලක්ෂණ ප්‍රදර්ශනය වන සේ වන්නම් නර්තනය කරයි.
ක්‍රියාකාරකම :1.2 වන්නම් නර්තනය කරමු.

## නිවැරදි පිළිතුර තෝරන්න .

1.ගජගා වන්නමේ තාලරූපය වන්නේ,
1)සුළු තනි තිත 2)දෙසුළුමහ තුන්තිත
3)තුන්සුළු දෙමහ පස්තිත 4)මහ තනි තිත
2.ගජගා වන්නම රචනා වී ඇත්තේ,
1)මහනුවර රාජ මාලිගාවේදී ය. 2)දෙවිනුවර උපුල්වන් දේවාලයේදී ය.
3)මහනුවර කවිකාර මඩුවේදී ය. 4)මහනුවර දළදා මාලිගාවේදී ය.
3.ගජගා වන්නමෙන් වර්ණනා වන්නේ,
1)දළදා පෙරහැරේ සධාතුක කරඬුව රැගත් මංගල හස්තිරාජයා ගැනය.
2)මොනයම් හෝ හස්තිරාජයෙකු ගැන ය.
3)රජුට තෑගි ලෙස ලැබුණු හස්තිරාජයෙකු ගැනය.
4)මිය ගිය ඇතෙකුගේ ගුණ වර්ණනාවක් ගැනය.
4.උඩරට වන්නම් අවසානයේ නටනු ලබන පද කොටස් පිළිවෙලින් සඳහන් වන්නේ,
1)සීරුමාරුව ,කස්තීරම ,අඩව්ව 2)ඉරට්ටිය ,අඩව්ව
3)කස්තීරම ,අඩව්ව 4)කස්තීරම,සීරුමාරුව, අඩව්ව
5 උඩරට වන්නම් 18 රචනා කළේ,
1)ශ්‍රී වික්‍රම රාජසිංහ රජ සමයේය. 2)ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ සමයේය.
3)ශ්‍රී විජය රාජසිංහ රජ සමයේය 4)මහා පරාක්‍රමබාහු රජ සමයේදීය.

## හිස්තැන් පුරවන්න.

6)වන්නම් නාමික වශයෙන් සමාන වන්නේ ......................, .................සම්ප්‍රදාය වලය.
7)දළදා පෙරහැරේදී ගජගා වන්නම........................ඉදිරිපිට නටනු ලබයි.
8)මුල් කාලයේ වන්නම් රචනා වී ඇත්තේ......................... සඳහා පමණි.
9)උඩරට වන්නම් සමග රචනා වූ තවත් ගායනා විශේෂයකි..........................
10)උඩරට වන්නම් රචනා කිරීම සඳහා................, ........................, .......................යන අය දායක වී ඇත.

## ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

11) ගජගා වන්නම හා සබැඳි පසුබිම හා සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න.
12)අදාල පද කොටස් තාල තබමින් කියන්න.
13)ගජගා වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරන්න .
14)බෙරවාදනයට අනුව කවි ගායනා කරමින් නර්තනය කරන්න.